# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.
## ප්‍රථම වාර පරීක්ෂණය - 2016
## 13 ශ්‍රේණිය
## චිත්‍රකලාව

කාලය පැය 03 යි.

නම : ...................................................................................................... පන්තිය : ....................

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.

  **I කොටස**
  - ප්‍රශ්න සියල්ලට ම **මෙම ප්‍රශ්න පත්‍රයේ** ම පිළිතුරු සපයන්න.
  - එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

  **II කොටස**
  - අනුකොටස් තුනකින් සමන්විත ය.
  - එක් එක් කොටසකින් **එක් ප්‍රශ්නය** බැගින් තෝරා ගෙන **ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න.


- I කොටසට හා II කොටසට අයත් පිළිතුරු පත් එකට අමුණා භාර දෙන්න.


---


## I කොටස

- **ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට A, B, C, D, E යන කැටයම් ඇතුළත් පින්තූර ඇසුරෙන් වඩාත් යෝග්‍ය පිළිතුර යටින් ඉරක් අඳින්න.**


A


B


C


D


E

01. A අක්ෂරයෙන් දැක්වෙන්නේ "ඉසුරුමුණියේ පෙම්යුවලය". මෙම කැටයම පිළිබඳ සෙනරත් පරණවිතාන මතය

(1) අග්නි සහ පර්ජන්‍යනය බව.
(2) සාලිය සහ අශෝකමාලා බව.
(3) යුධ සෙබළෙකු තම බිරිඳ හමු වූ අවස්ථාවක් බව.
(4) ශිව සහ පාර්වතී බව.
(5) විජ්ජුලතා සහ මේඝලතා බව.

02. B අක්ෂරයෙන් දැක්වෙන කැටයම "දුර්ගාදේවිය විසින් මී ගව යක්ෂයින් පලවා හැරීම" නම් හින්දු කතා පුවතයි. මෙම කැටයම දක්නට ඇත්තේ

(1) ශෝර්මර් දෙවොලේ ගල් පුවරුවක.
(2) කෛලාසනාථ දේවාලයේ.
(3) තින්තාල් ලෙනෙහි දෙවැනි මහලේ දකුණු බිත්තියේ.
(4) මහීෂමාධිනී ගුහාවේ.
(5) පළමුවන රාජේන්ද්‍ර චෝල රජු විසින් කරන ලද "කුම්භ කෝණම්" දේවාලයෙහි.

03. C අක්ෂරයෙන් දැක්වෙන කැටයම බුද්ධ චරිතයේ අවස්ථාවක් වන "සිදුහත් කුමාරෝත්පත්තිය"නම් කැටයමයි මෙම කැටයම අයත්වන්නේ

(1) මථුරා කලා සම්ප්‍රදායටය.
(2) අමරාවතී කලා සම්ප්‍රදායටය.
(3) ගාන්ධාර කලා සම්ප්‍රදායටය.
(4) ගුප්ත කලා සම්ප්‍රදායටය.
(5) භාරුත් කලා සම්ප්‍රදායටය.

04. D අක්ෂරයෙන් දැක්වෙන්නේ

(1) කණ්ථක චෛත්‍ය වාහල්කඩ.
(2) අටදාගෙයි කැටයමක කොටසක්.
(3) මිරිසවැටිය වාහල්කඩෙහි කොටසකි.
(4) ජේතවන විහාරයේ වාහල්කඩෙහි කොටසකි.
(5) රුවන්වැලිසෑය වාහල්කඩෙහි කොටසකි.

05. E අක්ෂරයෙන් දැක්වෙන්නේ බිහිසුණුබව හා ශාන්ත බව එකට කැටිකර ගත් අධික භාවමය හැඟීම් දක්වන ඉන්දියානු කැටයමකි.

(1) භාරුත්හි වක්‍රකාර, කැටයමක්වන මෙය නාලාගිරි දමනය නිරූපණය වෙයි.
(2) භාරුත්හි කැටයමක්වන මෙය ඡද්දන්ත ජාතකය නිරූපණය කරයි.
(3) අමරාවතී කැටයමක් වන මෙය නාලාගිරි දමනය නිරූපණය වෙයි.
(4) අමරාවතී කැටයමක් වන මෙය ඡද්දන්ත ජාතකය නිරූපණය කරයි.
(5) ගාන්ධාර කැටයමක් වන මෙය නාලාගිරි දමනය නිරූපණය වෙයි.

**ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුර යටින් ඉරක් අඳින්න.**

06. ගඩලාදෙනි විහාරය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ.

(1) මෙම නිර්මාණය සඳහා අනුරාධපුර යුගයේ සිදුවූ සංස්කෘතික පෙරළිය බලපාන ලදි.
(2) ගම්පල යුගයේදී නිර්මාණ කෙරෙහි බලපෑ ද්‍රවිඩ සංස්කෘතීන් මේ විහාරය කෙරෙහි බල නොපෑවේය.
(3) පිහිටි ගල් තලාවක් මත ඉදි වූ මෙම විහාරය කෝවිලක් සේ පෙණුනද සැබවින්ම බෞද්ධ පධීමාඝරයකි.
(4) බෞද්ධ වන්දනාවටම පමණක්ම මෙම විහාරය ඉදි කරන ලදි.
(5) ද්වාර මණ්ඩපය දෙපස ඇත් ද්ත්ව ගල් කුළුණු මෙම ගෘහනිර්මාණ අංගයට ගෙනෙන්නේ අලංකාරයකි.

07. බුදු පිළිම කලාව ලොව හඳුන්වා දීම සම්බන්ධයෙන් කුෂාණ කාලපරිච්ඡේදය මහත් මෙහෙවරක් සිදු කරන ලදි. කුෂාණ කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ.

(1) එකල බෞද්ධ කලා සම්ප්‍රදාය පිළිබඳ විචාරක මතයක් වන්නේ ග්‍රීක හා හින්දු කලාවේ සම්මිශ්‍රනයක් බවයි.
(2) ගාන්ධාරයේ ප්‍රථම බුදු රුව හිරාමත් හා සාජකී ඡේරී කරඬුවහි දක්නට ඇති බවය..
(3) දුෂ්කර ක්‍රියාව ප්‍රතිමාව මුල් කාලයේ කළ අභ්‍යන්තරික ගුණ සමුදායට වඩා භාහිර පෙනුම ගැන වැඩි අවධානයක් යොමු කරන ලද ප්‍රතිමාවකි. .
(4) ගාන්ධාර කලාවේ ශ්‍රේෂ්ටතම ඵලය කත්‍රා බුදු පිළිමය ලෙස හැඳින්වෙයි.
(5) මෙම කාලපරිච්ඡේදයේ බුද්ධ ප්‍රතිමාවල චීවරයේ රැලි රෝම සාටකයක් ලෙසත්, හිස ඇපලෝගේ හිස ලෙසත්, හිසෙහි උෂ්ණීශය ග්‍රීක සූර්ය දේව රූපයේ මකුටයට සම ලෙසත් නෙළා ඇත.

08. ශ්‍රී ලංකාවේ අවුකන හිටි පිළිමය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ.

(1) මෙම බුදු පිළිමය කලා වැව අසල අවුකන ග්‍රාමයේ පූර්ණ උන්නත ශිල්ප ක්‍රමය යටතේ නෙළා ඇත.
(2) මෙම පිළිමය ඉන්දීය අමරාවතී කලා ලක්ෂණ පෙන්නුම් කරයි.
(3) වමතින් අභය මුද්‍රාවද දකුණතින් කටක හස්ත මුද්‍රාවද යුක්තය.
(4) මෙම පිළිමය අනුරාධපුරයේ ඉදිවුවද සිරස්පත පසුකලෙක එක් වූ අංගයකි.
(5) පද්ම පීඨයක් මත ඍජු කායෙන් වැඩහිඳිනමෙය අනුරපුර ශිල්පියාගේ පරිණත බව පෙන්නුම් කරයි.


09. මිසර මූර්ති පිළිබඳව **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ.


(1) හැමවිටම එක්පාදයක් ඉදිරියට තබා දක්වා ඇත. ඉන් ප්‍රතිමාවේ සමබරතාවය රැකගැනීමේ උපක්‍රමයක් වෙයි.
(2) මිසරයේ නිර්මාණය කරන ලද නෙෆර්ටිටි ප්‍රතිමාව කාන්තා සුන්දරත්වයේ ප්‍රතිමූර්තියක් වෙයි.
(3) මෙම ප්‍රතිමාව භාව පූර්ණත්වය මෙන්ම ශරීරාංගයන් ද මස්පිඩු දැකීම් හා ක්‍රියාකාරිත්වය මනාව දක්වා ඇත.
(4) ස්ෆින්ක්ස් රුවෙන් මිසරයේ තේජාන්විත බව අභිමානය දක්වන මිනිස් හා සිංහ ශරීරයකින් යුතු මූර්තියකි.
(5) රැමේසස් රජු හා බිසවගේ විශාල ප්‍රමාණයේ මූර්ති පංතියක් අබුසිම්බල් දේවස්ථානයේ නිර්මාණය කර ඇත.


10. ඉන්දීය මෞර්ය යුගයේ අධිරජ ධර්මාශෝක රජු විසින් කරවූ සාංචි ස්තූපය හා සම්බන්ධ තොරණ අති විශිෂ්ට නිර්මාණයෝය. ඉන් උතුරු තොරණේ දක්නට ඇති කැටයම් වන්නේ.

(1) වෙස්සන්තර ජාතකය, ඡද්දන්ත ජාතකය සහ මහා කපි ජාතකය.
(2) සංකස්සපුර හිණිමං දර්ශනය, වෙස්සන්තර ජාතකය සහ මහා කපි ජාතකය.
(3) ඡද්දන්ත ජාතකය, අශෝක රජු ශ්‍රී මහා බොධිය වැඳීම සහ වෙස්සන්තර ජාතකය.
(4) ධාතු කෝලාහලය, ඡද්දන්ත ජාතකය සහ ජටිල දමනය.
(5) පෙර බුදුවරු හත්නම සංකේතවත් කරන බෝ වෘක්ෂ, සංකස්සපුර හිණිමං දර්ශනය සහ ඡද්දන්ත ජාතකය.

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට F, G, H, I, J යන මූර්ති ඇතුළත් පින්තූර ඇසුරෙන් වඩාත් යෝග්‍ය පිළිතුර යටින් ඉරක් අඳින්න**


F


G


H


I


J

11. F අක්ෂරයෙන් දැක්වෙන්නේ මිසරයේ "කුරුළු දඩයම සිතුවමයි" එම සිතුවම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) පාර්ශවගත මානව රූප හා සත්ව රූප දක්නට ඇත.
(2) මිනිස් රූප ශෛලීගත වුවත් සත්ව රූප ඉතා ස්වාභාවික ලෙස සිතුවම් කර ඇත.
(3) මෙම රූපයෙන් දක්වන්නේ රජකෙනෙක් බිරිඳ හා සේවිකාව සමඟ දඩයමේ යාමයි.
(4) මෙම සිතුවම නයිල් නිම්නය අසල එඩ්ෆූ දෙවස්ථානයේ බිත්තියක් මත සිතුවම් කර ඇත.
(5) මෙම සිතුවම්වල හැඟීම් ඉතා හොඳින් නිරූපණය කිරීමට ශිල්පියා සමතව ඇත.

12. G අක්ෂරයෙන් දැක්වෙන සිතුවම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) අනුරාධපුර යුගයට අයත් තිවංක පිළිමගෙයි දේවාරාධනය නම් සිතුවමයි.
(2) මෙම සිතුවම තිවංක පිළිමගෙයි බිත්ති තලයමත තෙල් සායමෙන් අඳින ලද ෆ්‍රෙස්කෝ සිකෝ සිතුවමකි.
(3) තිවංක පිළිමගෙයි සිතුවම් අතර ඇති සිතුවමක් වන මෙය මණ්ඩප කොටසේ දක්නට ඇත.
(4) මෙහි දැක්වෙන පද්මයක් අතින් ගත් නිල් පැහැති දේවතා රුව දේවාරාධනයෙහි එන උපුල්වන් දෙවියන් නිරූපණය කරන බව විද්වත් මතයයි.
(5) මෙම සිතුවමේ වස්තු විෂය වන්නේ බුදුන් වහන්සේ තවුතිසා දෙව්ලොවට වැඩම කර දෙවියන්ට ධර්මය දේශනා කිරීමේ කතා වස්තුවයි.

13. H අක්ෂරයෙන් දැක්වෙන සිතුවම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) මහායාන සංකල්පයට අනුව "අවලෝකිතේශ්වර බෝසතුන්" නිරූපණය කර ඇත.
(2) අලංකාර හිස්වැස්මකින් සැරසී සිටින ගෙල කර්ණ මුතු මැණික් ආභරණ සහිත කෝමළ හස්තයෙන් යමක් පවසන අප්සරා රූපයයි.
(3) මෙම සිතුවම දක්නට ඇත්තේ ඉන්දියාවේ අජන්තා ලෙන් විහාර සංකීර්ණයේ 17වන ලෙනෙහිය.
(4) තිභංග ඉරියව්වෙන් හා මනා හැඩහුරුකම්න් යුතු මෙම සිතුවම "පද්මපාණී බොධිසත්ව" රුව නම් වෙයි.
(5) මෙය ගුප්ත යුගයේ අවසාන භාගයේ කරන ලද සිතුවම් ඇති අජන්තාවේ අංක 01 ලෙනෙහි දක්නට ඇත.

14. I අක්ෂරයෙන් දැක්වෙන සිතුවම පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) මෙම සිතුවම මහනුවර උඩරට සම්ප්‍රදායට අයත් දෙගල්දොරුව ලෙන් විහාරයේ දක්නට ඇති සිතුවමකි.
(2) මෙය අඛණ්ඩකථන ක්‍රමයෙන් කර ඇති වෙස්සන්තර ජාතකයේ ඇලි ඇතුන් දන්දීමයි.
(3) මෙම සිතුවම් පසුබිම රතු වර්ණය සහිතවන අතර හිස්තැන් පිරවීම සඳහා නෙලුම් මල යොදා ඇත.
(4) මෙම විහාරයේ සිතුවම් තීරු පුළුල්වන අතර ඒවා අඟල් 30ක් පමණ පළලින් යුක්තය.
(5) මෙම සිතුවම් ශෛලීගත ස්වරූපයෙන් යුක්තය. මානව රූප පාර්ශව දර්ශීය වීම විශේෂ ලක්ෂණයකි.

15. J අක්ෂරයෙන් දැක්වෙන සිතුවම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) මෙම සොභා සෞන්දර්යයෙන් යුතු සිතුවම අක්බර් රාජසමයේ කරවන ලද "ලේනුන් පිරි ගස" සිතුවමයි.
(2) මෙම සිතුවම් සඳහා විශිෂ්ට ලලිත වර්ණ ද්විමානව වර්ණ තන්වා ඇත.
(3) හින්දු සාහිත්‍ය පදනම් කරගනිමින් සංකේතාත්මක උපමා කාව්‍ය ඇසුරින් නිර්මාණය කර ඇත.
(4) ස්වාභාවිකත්වයෙන් ඈත් වූ සරල සංකේතාත්මක හැඩතල රටා ඔස්සේ ගොඩනැගුන ශෛලීගත සිතුවමකි.
(5) මෙය ජෙහන්ගීර් රාජ්‍ය සමයේ නිර්මාණය කරන ලද "ලේනුන් පිරි ගස" නම් සිතුවමයි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට පහත සඳහන් සිතුවම් ඇසුරින වඩාත් යෝග්‍ය පිළිතුර යටින් ඉරක් අඳින්න.**

16. අනුරාධපුර යුගයේ සඳකඩ පහන් අතරින් අනුරාධපුර බිසෝමාළිගයේ දොරටුවේ ඇති සඳකඩ පහන විශිෂ්ට කැටයම් වලින් යුක්ත පුවරුවකි. එහි කැටයම් පිළිවලින්,

(1) ගිනිදල්ල, සත්වපේළිය, මහා ලියවැල, හංස පේළිය, කුඩා ලියවැල සහ නෙලුම
(2) ගිනිදල්ල, මහා ලියවැල, සත්වපෙළිය, හංස පේළිය, කුඩා ලියවැල සහ නෙලුම
(3) ගිනිදල්ල, මහා ලියවැල, සත්වපේළිය, කුඩා ලියවැල, හංස පේළිය සහ නෙලුම
(4) ගිනිදල්ල, සත්වපේළිය, ලියවැල, හංස පේළිය සහ නෙලුම
(5) මහා ලියවැල, ගිනිදල්ල, සත්වපේළිය, කුඩා ලියවැල, හංස පේළිය සහ නෙලුම

17. ඉන්දියාවේ නූතන ශිල්පියෙකුවන "ජෙමිනි රෝයි" ශිල්පියාගේ සිතුවම්වල දක්නට ඇති සුවිශේෂීත්වය වන්නේ,

(1) අජන්තා එල්ලෝරා භාග් මෙන්ම මෝගල් චිත්‍ර සම්ප්‍රදායේ ඇති සිතුවම්වල රේඛාව වර්ණ හැසිරවූ ආකාරය අනුව එළිය අඳුර ත්‍රිමාණ ලක්ෂණ දක්වමින් සිතුවම් ඇඳීම.
(2) මෝගල් රාජ්පුට් මෙන්ම චිත්‍ර ශෛලින් හා චීන ජපන් චිත්‍ර ශෛලින් හා ශිල්පක්‍රම ආභාශයට ගැනීම.
(3) ඉන්දියානු ජනයාගේ අනේකවිද දුක් දොම්නස් හා ජීවත් වීමට දරන වෙහෙස කාරී පීඩාවන් වස්තුවිෂය වශයෙන් ගෙන සිතුවම් නිර්මාණය.
(4) මෙම ශෛලිය තුළ ද්විමාන බවක් දක්නට ඇත රේඛාකරණයෙන් පසු හැඩතල පිරී යනසේ වර්ණ පූර්ණය කර බාහිර රේඛාවක් යෙදීය නිදසුන් ලෙස "කාන්තාවන් තිදෙනා"
(5) ස්වාභාවිකත්වයෙන් ඉවත්ව ගැඹුරු භාව ප්‍රකාශනයකින් යුත් මෙම සිතුවම් කිහිපයක් නම් "බළලුන් දෙදෙනා" , "ඉස්සෝ බළලා" සහ "පොකිරිස්සා" යන සිතුවම් නිදසුන් වෙයි.

18. මිසර කැටයම් කලාවේ විශිෂ්ට පුවරු කැටයමක් වන "හෙසිරා" කැටයම පිළිබඳ නිවැරදි වැකිය වනුයේ,

(1) මිසර මූර්තී ශෛලියෙන් යුක්තව පුද්ගල රුව කැටයම් කර ඇති මෙම කැටයම ටෙරාකොටා පුවරුවක් මාධ්‍ය ලෙස යොදාගෙන ඇත.
(2) පැත්තට හැරී සිටින මානව රුව වම් පසට වන්නට යොදා ඇති අතර තලය සමබර කිරීමට ලීයක් බඳු උපකරණයක් යොදා තිබෙයි.
(3.) ලී මාධ්‍ය යොදා ගනිමින් කර ඇති මෙම පුද්ගල රුව ඉදිරි පෙනුම සහිතය.
(4) පුළුල් උරහිස සහ පපුව ඉදිරියට යොමා සිටිනඅතර දකුණත දකුණු පාදයටසමාන්තරව පහතට හෙලා ඇත.
(5) මෙම හෙසිරා ලෝහ ඵලකය මස්ටබා සොහොන් ගෙයකින් හමු වී ඇත.


19. ශ්‍රී ලාංකීය චිත්‍ර ශිල්පියෙකු වූ "ජෝජ් කීට්" ශිල්පියාගේ විහාර සිතුවම් පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,


(1) රේඛා කර්මය වර්ණ පූර්ණය ශිල්පියාගේ ආත්ම භාවය පෙන්වන සුළුය. දුඹුරු වර්ණයේ ප්‍රභේද හා සුදු වර්ණ පමණක් භාවිතා කර ඇත.
(2) රේඛා හැඩතල මෙනම වර්ණය හසුරවා ඇත්තේ බැතිබර සිත් පහන් කිරීමට සමත් ලෙසය මොහුගේ සිතුවම් තේමා නාට්‍යානු සාරයෙන් යුක්තය.
(3) ඍජු රේඛීය ඝන හැඩතල හා මිනිස් ඉරියව්වලින් යුත් තමාටම උරුම සරල මානව හැඩතල ඇසුරින් විහාර සිතුවම් කලාවක් ගොඩනැගීය.
(4) ඝනික වාදී ලක්ෂණ සිහිපත් කරමින් රේඛාව හා පැතලි වර්ණ භාවිතය තුළින් සිතුවම් ඇඳි මේ ශිල්පියා කැළණි විහාරයේ සිතුවම් අඳින ලදි.
(5) යුරෝපයේ සිතුවම් ක්‍රමවේද අනුව ඇඳි මොහුගේ සිතුවම් තුළින් බුද්ධාලම්භන ප්‍රීතියක් සේම ශ්‍රද්ධා භක්තිය ඇති කරලීමට සමත්ය.

20. "පැබ්ලෝ පිකාසෝ" ශිල්පියාගේ සිතුවම් පිළිබඳ නිවැරදි වැකිය වනුයේ,

(1) මොහු සිතුවම් ඇඳි ප්‍රධාන යුග තුනකි. ඒ රෝස යුගය, නිල් යුගය, ඝනික යුගය වශයෙනි. "ගෝලය මත සිටින දැරිය" සිතුවම ඝනික යුගයේ ඇඳි සිතුවමකි.
(2) නිල් යුගයේදී ඔහු ඇඳි සිතුවම් තේමා අති මානුෂික වූ අතර සමාජයේ විවිධ දුක් පීඩාවන්ට ලක්වූවන් මෙම චිත්‍රවලට ප්‍රධාන චරිත විය.
(3) ඔහුගේ ඉතා ප්‍රභල සිතුවමක් වන්නේ "ගුවර්නිකා"සිතුවමයි. මෙහි දී සිවිල් යුද්ධයේදී මිනිසුන් අත්විඳි දුක් ගැහැට පැස්ටල් මාධ්‍ය යොදා ගනිමින් නිර්මාණය කර ඇත.
(4) ඝනික වාදයේ පුරෝගාමියා වූ මේ ශිල්පියාගේ ප්‍රභල සිතුවමක් ලෙස "මැන්ඩලීනය අතින් ගත් යුවතිය" පෙන්වා දිය හැකිය.
(5) "ගුවර්නිකා" , "අවිග්නෝන්හි යුවතියෝ" , "මහලු ගිටාර්වාදකයා" සහ "මැනිඩගීනය අතින්ගත් යුවතිය" ඔහුගේ නිර්මාණයන්ය.

- **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට K, L, M, N, O යන ප්‍රතිමා ඇතුළත් පින්තූර ඇසුරෙන් වඩාත් යෝග්‍ය පිළිතුර යටින් ඉරක් අඳින්න.**


K


L


M


N


O

21. K අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) මහඉලුක්පල්ලම බුදු පිළිමයයි. (2) අවුකන බුදු පිළිමයයි. (3) මාළිගාවිල බුදු පිළිමයයි.
(4) බුදුරුවගලින් හමු වූ බුදු පිළිමයයි. (5) සැස්සේරුව බුදු පිළිමයයි.

22. L අක්ෂරයෙන් දැක්වෙන ප්‍රතිමාවේ ශිල්පියා වන්නේ,

(1) ඇන්ටිසෝව් (2) මයිරන් (3) මයිකල් ආන්ජිලෝ (4) ප්‍රැක්සිටිලස් (5) පීඩියාස්

23. M අක්ෂරයෙන් දැක්වෙන පිළිමය,

(1) මථුරා බෝසත් පිළිමයකි. (2) සහරි බහලෝල් බුද්ධ ප්‍රතිමාව. (3) බ්‍රෙගම්හි බුද්ධ ප්‍රතිමාව.
(4) තක්තිබහී බුද්ධ ප්‍රතිමාව. (5) කත්‍රා බුද්ධ ප්‍රතිමාව

24. N අක්ෂරයෙන් දැක්වෙන්න ප්‍රතිමාව පිළිබඳ නිවැරදි සංකල්පය වන්නේ,

(1) පාගාගෙන සිටින වාමනයාගෙන් විද්‍යාව දුරලීම සංකේතවත් කරයි..
(2) අභය මුද්‍රාවෙන් බැතිමතුන් තමා වෙත කැඳවා ගැනීම සංකේතවත් කරයි.
(3) දකුණත ඇති ඩමරුව හෙවත් උඩැක්කියෙන් විනාශය සංකේතවත් කරයි.
(4) නර්තනයේ වේගයට දෙපසට විහිදුනු හිසකේ කැරලි වලින් යමුනා නදිය සංකේතවත් කරයි.
(5) ශිවදෙවියන්ගේ නර්තන විලාශයෙන් විශ්වයේ පැවැත්ම හා විනාශය සංකේතවත් කරයි.

25. O අක්ෂරයෙන් දැක්වෙන ප්‍රතිමාවේ ශිල්පියා වන්නේ,

(1) මයිකල් ආන්ජෙලෝ (2) ලියනාඩෝ ඩාවින්චි (3) රෝයල් සැන්ටි (4) මයිරන් (5) ෆීඩියාස්

- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුර යටින් ඉරක් අඳින්න.**

26 පාරම්පරික වෙස් මුහුණු කර්මාන්තයේ වෙස්මුහුණු වර්ණ ගැන්වීමට පෙර සුදුගෑම හෙවත් මකුළු මැටි ගෑම සිදු කරයි. මෙය හඳුන්වන්නේ,

(1) ලකුණු කැපීම. (2) සන කැපීම. (3) අල්ලියාදු කිරීම. (4) පායම් පෑහීම (5) වයිති කිරීම.

27. සත්ව ගණයට අයත් කල්පිත නොවන සත්ව රුවක් වන්නේ,

(1) භේරුණ්ඩ පක්ෂියා (2) ගජ සිංහ (3) සිංහයා (4) සැරපෙන්දා (5) ඇත්කඳ ලිහිණියා

28. ලාක්ෂා කර්මාන්තයේදී ශිල්ප ක්‍රම දෙක වන්නේ,

(1) තලන වැඩ හා නියපොතු වැඩ (2) නියපොතු වැඩ හා පට්ටල් වැඩ (3) පට්ටල් වැඩ හා තලන වැඩ
(4) තහඩු වැඩ හා නියපොතු වැඩ (5) පට්ටල් වැඩ හා වාත්තු වැඩ


29. පැරණි ප්‍රභූ ආභරණ වලදී එනම් ගෙලමාල පදක්කම් සඳහා යොදා ගන්නා පාරම්පරික සැරසිල්ල වන්නේ,

(1) නෙලුම් මල (2) භේරුණ්ඩ පක්ෂියා (3) හංස පූට්ටුව (4) සැරපෙන්දා (5) මකර රුව

30. කිත්තුල කලාල කර්මාන්තයේදී යොදා ගන්නා අමුද්‍රව්‍ය වනුයේ,


(1) නියඳ කෙඳි හා පතගි පොතු. (2) නියඳ කෙඳි හා සාදලිංගම්. (3) පන් කොළ හා පතගි.
(4) වැටකෙයියා හා සාදලිංගම්. (5) තල් කොළ හා කොර කහ.


- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට P, Q, R, S, T යන සිතුවම් ඇතුළත් පින්තූර ඇසුරෙන් වඩාත් යෝග්‍ය පිළිතුර යටින් ඉරක් අඳින්න.**


P


Q


R


S


T

31. P අක්ෂරයෙන් දැක්වෙන්නේ ඇම්බැක්ක දේවාලයේ ඇති "මඬොල් කුරුපාවයි" මෙහි ගෘහ නිර්මාණ ශිල්පියා,

(1) දේවේන්ද්‍ර මූලාචාරියා. (2) ගනේශ්වරාචාරියා. (3) ස්ථපතිරායර්.
(4) දෙවරගම්පොල සිල්වත් තැන. (5) දෙල්මඩු මූලාචාරියා.

32. Q අක්ෂරයෙන් දැක්වෙන ඉන්දීය පංච පාණ්ඩව රථ අතුරින් එකකි, එනම්

(1) ද්‍රවුපදී රාත්. (2) අර්ජුන් රාත්. (3) භීම රාත්. (4) ධර්මරාජ රාත්. (5) සහදේව රාත්.

33. R අක්ෂරයෙන් දැක්වෙන නයිල් ගංගාධාරයේ නැගෙනහිර වෙරළේ ඉදිකරන ලද ඇමෝන් හිරුදෙවියන් වෙනුවෙන් කැප කරන ලද දේවස්ථානයකි. මෙම දෙවොල,

(1) එඩ්ෆු (2) ලක්සෝර් (3) හට්සෙප්ෂුට් (4) කානැක් (5) අබුසිම්බල්


34. S අක්ෂරයෙන් දැක්වෙන්නේ පොළොන්නරු යුගයේ විසූ නිශ්ශංක මල්ල රජුගේ අනුග්‍රහයෙන් කරවන් ලද නිශ්ශංක ලතා මණ්ඩපයයි. මෙම ගොඩනැගිල්ල යොදාගන්නා ලද්දේ,

(1) රාජ්‍ය මන්ත්‍රණ සභාවක් ලෙස. (2) රඟුම් මන්දිරයක් ලෙස.
(3) රජුට විවේක සුවය ගත කිරීමට. (4) විහාරයක් ලෙස භික්ෂූන් වහන්සේලාට පවරා ඇත.
(5) රජුට පරිත්‍රාණ ධර්මය ශ්‍රවනය හා දළදා වහන්සේ වන්දනාමාන කිරීමට.

35. T අක්ෂරයෙන් දැක්වෙන්නේ භාරතයේ විශිෂ්ට ගෘහ නිර්මාණ ලෙන් රැසකින් යුත් එල්ලෝරාවෙහි ඇති සුවිශේෂී ලෙනකි,

(1) විශ්වකර්ම ලෙන (2) රාමේශ්වර ලෙන (3) කෛලාසනාථ ලෙන
(4) දූමාර් ලෙන (5) තින්තාල් ලෙන

- **ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට සිතුවම් ඇතුළත් පින්තූර ඇසුරෙන් වඩාත් යෝග්‍ය පිළිතුර යටින් ඉරක් අඳින්න**



U



V

36. U අක්ෂරයෙන දැක්වෙන සිතුවම ලොව විශාලතම ප්‍රෙස්කෝ සිකෝ සිතුවමයි. මෙම සිතුවම නිර්මාණය කළ ශිල්පියා හා දක්නට ඇති ස්ථානය වන්නේ,

(1) රෆායල් ශිල්පියා සහ සිස්ටයින් දෙව්මැදුර සීලිමෙහි.
(2) මයිකල් ආන්ජෙලෝ ශිල්පියා සහ ශාන්ත පීතර දෙව් මැදුර.
(3) මයිකල් ආන්ජෙලෝ සහ ශාන්ත මරියා දෙව්මැදුර.
(4) මයිකල් ආන්ජෙලෝ සහ සිස්ටයින් දෙව්මැදුර.
(5) මයිකල් ආන්ජෙලෝ සහ සිස්ටයින් දෙව්මැදුර අල්තාරයේ.

37. U අක්ෂරයෙන දැක්වෙන සිතුවම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) මෙම විශාල සිතුවමේ අනර්ගම කොටස ආදම් මැවීමයි. මෙහි දකුණුපස දෙවියන් දේව දූතයන් සමඟ වළාකුළු අතර සිටින අයුරු හා ආදම් දෙවියන් වෙත අත දිගුකරන අපූරුවට දක්වා ඇත.
(2) ක්‍රිස්තුස් වහන්සේ අහසේ සිටින අයුරින් දැක්වෙන අතර මෙහි මධ්‍යයේ කඳුගැටයමත වැතිර සිටින පිරිසකි. දෙවියන්ගේ ප්‍රාතිහාරය දකින පිරිස් විමතියට පත්ව ඇති ආශ්චර්යමත් සිද්ධිය නිරූපණය කර ඇත.
(3) චිත්‍රය තුළ මිනිස් චර්යා රැසක් එක්රැස් කිරීමට වෙහෙසන ශිල්පියා ඔවුනොවුන් අතර ක්‍රියාකාරී සබඳතා දැක්වෙනඅයුරින් හඟීම් දැක්වෙන අයුරින් මානව රුව හැසිර වීමට රෆායල් ශිල්පියා සමත්ව ඇත.
(4) මෙම සිතුවම ප්‍රධන කොටස් තුනකට බෙදා සිතුවම්කර ඇත. මෙහි ස්වර්ගය, මනුලොව සහ නිරය යන අවස්ථා නිරූපණය කර ඇත.
(5) ළය සසල කරවන වන් ඇසීමෙන් අනුගාමිකයන් තුළ වූ මානසික කම්පනය හා ඒ ගුළින් මතු වූ අනපේක්ෂිත චර්යාවන් යථාර්ථ වාදීව ප්‍රකාශනය කරීම ශිල්පියාගේ අභිප්‍රාය විය.

38. V අක්ෂරයෙන දැක්වෙන සිතුවමහි නිරූපණය වන්නේ ,

(1) ඩේවිඩ් ජේන්ටර් ශිල්පියා අඳින ලද ''යහපත් සමරිතානුවා'' සිතුවමයි.
(2) ඩේවිඩ් ජේන්ටර් ශිල්පියා අඳින ලද ''ජයග්‍රාහීලෙස ජෙරුසෙලමට ලඟාවීම'' සිතුවමයි.
(3) ඩේවිඩ් ජේන්ටර් ශිල්පියා අඳින ලද ''පා දෝවනය '' සිතුවමයි.
(4) ජෝජ් කීට් ශිල්පියා අඳින ලද ''ජයග්‍රාහීලෙස ජෙරුසෙලමට ලඟාවීම'' සිතුවමයි.
(5) ජෝජ් කීට් ශිල්පියා අඳින ලද ''පා දෝවනය '' සිතුවමයි.

39. V අක්ෂරයෙන දැක්වෙන සිතුවම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) මොහුගේ සිතුවම් වස්තුවිෂය වූයේ අර්ධ නාගරික පරිසරයයි. පරිසරයේ සිදධි සිතුවම් කිරීමට වැඩි කැමත්තක් දැක්විය.
(2) බටහිර ශාස්ත්‍රාලීය චිත්‍ර කලා සම්ප්‍රදායන් ගුරු කොට ගනිමින් සරල හැඩතල අර්ථවත්ව ප්‍රකාශයේ යෙදීම මොහුගේ ශිල්ප ක්‍රමය වෙයි.
(3) යුරෝපීය සම්භාව්‍ය චිත්‍ර කලාවේ සියලු ලක්ෂණ අනුකරණය නොකොට ලාංකීය ජන ජීවිතයේ චරිත වියලි කලාපීය පසුබිම දීප්තිමත් වර්ණ භාවිතයෙන් ප්‍රකාශනය වෙයි.
(4) මෙම සිතුවම තුළින් භාවමය හැඟීම් දැනවීමට ආදරය සෙනෙහස ප්‍රේමය වැනි සංකල්ප කාව්‍යමය රසයෙන් යුතුව ප්‍රකාශය කර ඇත.
(5) ආයතනික සම්ප්‍රදායන් හෝ න්‍යායන් පිළිබඳව සැලකිල්ලක් නොදක්වා කිසියම් සිදුවීමක් නව තාවයකින් ඉදිරිපත් කර ඇත.

40. V අක්ෂරයෙ දැක්වෙන සිතුවම ඇඳි ශිල්පියාගේ සිතුවම් පෙළ වන්නේ,

(1) මව සහ දරුවා, පා දෝවනය.
(2) මව සහ දරුවා, මහල්ලා සහ දරුවා.
(3) වී එකතු කරන්නන්, මාලුවා සහ කාන්තාව.
(4) පා දෝවනය, මහල්ලා සහ දරුවා.
(5) ජයග්‍රාහී ලෙස ජෙරුසෙලමට ලඟා වීම, මහල්ලා සහ දරුවා.

## II කොටස

- "අ" "ආ" සහ "ඉ" වශයෙන් අනුකොටස් තුනකින් සමන්විත ය.
- එක් එක් කොටසකින් **එක් ප්‍රශ්නය** බැගින් තෝරා ගෙන **ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න.

### "අ" කොටස

( චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව )

01. ශ්‍රී ලාංකික බුදු පිළිම කලාව අප රටේ මූර්ති කලාවේ එක් සුවිශේෂී පැතිකඩක් නිරූපණය කරන්නක් වෙයි.

i. අනුරාධපුර යුගයට අයත් බුද්ධ ප්‍රතිමා 5ක් නම් කරන්න.

( ලකුණු 05)

ii. ශ්‍රී ලාංකීය ප්‍රතිමා කලාවේ ක්‍රමික වූ විකාශනයකින් යුක්තවන අතර බුද්ධ ප්‍රතිමා එක් එක් යුගයන් වලදී මාධ්‍ය භාවිතය ශෛලිය හා කලාත්මක ලක්ෂණ වලින් වෙනස් වූ ආකාරය පිළිබඳව උදාහරණ සහිතව විමසීමක් කරන්න.

( ලකුණු 15)

02. අනුරාධපුර යුගයේ සිතුවම් ලාංකික සිතුවම් කලාවේ මහා සම්ප්‍රදායේ සිතුවම් කලාව ලෙස හඳුන්වයි. පැරණි ලාංකික චිත්‍ර ශිල්පීන්ගේ ප්‍රතිභාව මෙම සිතුවම් කලාවෙන් ලොවට පෙන්වන්නකි.

i. ලාංකික සිතුවම් කලාවේ මහා සම්ප්‍රදායේ අනුරාධපුර යුගයට අයත් සිතුවම් දැකගතහැකි ස්ථාන 10ක් නම් කරන්න.

( ලකුණු 05)

ii. සීගිරි සිතුවම් හා හිඳගල සිතුවම් අප රටේ සිතුවම් කලාවේ එකම යුගයකට අයත් වුවද කලාකෘති අධ්‍යනයේ දී මෙම සිතුවම් අතර සමානකම් මෙන්ම අසමානකම්ද දැකගත හැක. උක්ත කියමන පිළිබඳ නිදසුන් සහිතව විමසීමක් කරන්න.

( ලකුණු 15)

### "ආ" කොටස

( චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව )

03. ගාන්ධාර බෞද්ධ කලාව යනු ග්‍රීක රෝම පර්සියන් කලා සම්ප්‍රදායන් අනුව බෞද්ධ වස්තු විෂයයන් ප්‍රකාශ කිරීමට ගත් උත්සාහයක ප්‍රතිපලයකි.

i. ගාන්ධාර ශිල්පීන් විසින් නිර්මාණය කළ බුදු පිළිම 05ක් නම් කරන්න.

( ලකුණු 05 )

ii. බුදු සිරිතෙහි සිද්ධි නිරූපණය කිරීමේදී ගාන්ධාර ශිල්පීන් බෞද්ධ සංකල්ප නිරූපණයට නුහුරු බවක් දක්වා ඇත "සිදුහත් උපත" නම් වූ කැටයම ඇසුරෙන් මේ කියමන පහදන්න

( ලකුණු 15 )

04. බෞද්ධ හින්දු හා ජෛන ආගම්වලට අයත් සිද්ධස්ථාන ඇතුළත් එල්ලෝරාව කැටයම් නිර්මාණ රැසකට උරුම කම් කියන මධ්‍යස්ථානයකි

i. එල්ලෝරා ගුහා ඇසුරින් ජෛන ගුහා 02ක් හා බෞද්ධ ගුහා 03ක් නම් කරන්න.
( ලකුණු 05)

ii. හින්දු ගුහා අතුරින් කෛලාසනාථ දෙවාලයේ වාස්තු විද්‍යා ශිල්පය පිළිබඳ විග්‍රහයක් කරන්න
( ලකුණු 15)

## "ඉ" කොටස

( චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය )

05. ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයා තුළ වූ සෞන්දර්ය ඥානය පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය කරගැනීමට ගුහා චිත්‍ර ඇසුරින් හැකි වී ඇත.

i. ප්‍රාග් ඓතිහාසික යුගයේ යුරෝපීය ගුහා 05ක් නම් කර එහි ඇති විශේෂිත වූ සිතුවමක් බැගින් ලියන්න.
( ලකුණු 05)

ii. ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයා තුළ වූ සෞන්දර්ය ඥානය පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය කරගැනීමට ගුහා චිත්‍ර ඇසුරින් හැකි වී ඇත උක්ත කියමන නිදසුන් සහිතව විමසීමක් කරන්න.

( ලකුණු 15)

06. මිසරයේ ඉපැරණි කලා නිර්මාණ අදටත් ලොව මවිත කරන අභිරහසකි.

i. මිසරයේ පැරණි ප්‍රකට මූර්ති 03ක් සහ සිතුවම් 02ක් නම් කරන්න .
( ලකුණු 05)

ii. පිරමීඩ නිර්මාණය සහ විකාශය පිළිබඳ නිදසුන් සහිතව විමසීමක් කරන්න.

( ලකුණු 15)